# දැහැමි ලෙස පිළි ගනු ලබන අයුරින් හජ් වන්දනාව ඉටු කරමු

# الحج المبرور

<Sinhala- සිංහල -سنهالية>


සංස්කාරකගේ නම

යාසිර් මුහම්මද් අල් ෆහීද්

ياسر محمد الفهيد

පරිවර්තකගේ නම

මාහිර් රම්ඩීන්

විචාරය කිරීම

මුහම්මද් අසාද්

ترجمة:

ماهر رمدين

مراجعة:

محمد آساد

# දැහැමි ලෙස පිළි ගනු ලබන අයුරින් හජ් වන්දනාව ඉටු කරමු.

සැකසුම : යාසිර් මුහම්මද් අල් ෆහීද්

සිංහලෙන් : මව්ලවි මාහිර් ටී.ඩී. රම්ඩීන්









# දැහැමි ලෙස පිළි ගනු ලබන අයුරින් හජ් වන්දනාව ඉටු කරමු.

තමත්තුඃ ක්‍රමයට හජ් ඉටු කරන්නන් සඳහා ඔවුන් කරන සෑම ක්‍රියාවක්ම ඊට අදාළ නීතිය සහිත ව පිළිවෙළට හජ් ඉටු කිරීමේ අදියරයන්

| අංක | පිළිවෙත් | විස්තර | | | පටහැණිව කළ විට එහි නීතිය |
|---|---|---|---|---|---|
| | | අංක | නීතිය | ක්‍රියා | |
| පළමු අදියර | යව්මුත් තර්වියා නම් 8 වැනි දින<br><br>හජ් නැමදුමෙහි පිවිසීම සඳහා අධිෂ්ඨාන කර ගනිමින් ඉහ්රාම් ඇඳීම | 1 | සුන්නා | ස්නානය කොට පිරිසිදු වීම නැමදුමට පිවිසීමට පෙර පුරුෂ පාර්ශවය පමණක් සුවඳ විලවුන් ගැල්වීම | කිසිවක් නැත |
| | | 2 | සුන්නා | ඉහ්රාම් ඇඳීමේදී පිරිමියා උඩුකය හා යටිකය වශයෙන් පිරිසිදු සුදු පැහැති රෙදි කඩ දෙකක් ඇඳිය යුතු අතර කාන්තාව අලංකාර හා ආකර්ෂණය ඉස්මතු නොවනාකාරයට ඇය කැමති ඇඳුමක් ඇඳිය හැක. | කිසිවක් නැත |
| | | 3 | සුන්නා | තමත්තුඃ ක්‍රමයට ඉහ්රාම් ඇන්ද අය තමන් සිටින ස්ථානයේම ඉහ්රාමය ගළවා හජ් සඳහා නැවත ඉහ්රාම් ඇඳ ගනී. පසුව 'ලබ්බයික් හජ්ජන් හෝ අල්ලාහුම්ම ලබ්බයික් හජ්ජන් යනුවෙන් චේතනා කර ගනී | කිසිවක් නැත |
| | | 4 | සුන්නා | රෝගී භාවය හෝ වෙනත් යම් හේතුවක් මත වන්දනාව පූර්ණ කිරීමට යම් බාධාවක් ඇති වූ විටෙක කොන්දේසි පනවා ගත යුතුය. එනම් *අල්ලාහුම්ම ලබ්බයික් හජ්ජන් ෆඉන් හබිස නී හාබිසු ෆමුහිල්ලී හයිසු හබිසනී* (යා! අල්ලාහ්, හජ් ඉටු කරන්නෙකු ලෙස මා ඔබ සමීපයට පැමිණෙන්නෙමි. නමුත් යම් බාධාවක් ඇති වූ විටෙක බාධාව ඇති වූ ස්ථානයේම මම ඉහ්රාමයෙන් මිදෙමි) යනුවෙන් කොන්දෙසි පනවා ගත යුතුය. නමුත් කිසිදු හේතුවක් නොමැති විටෙක එසේ කොන්දේසි පැනවීම සුන්නත් නොවේ. | කිසිවක් නැත අංක 1 බලන්න |
| | | 5 | සුන්නා | වන්දනාවෙහි නිරත වූ පසු තල්බියා පැවසීම, එය අධික ව පැවසීම දස වැනි දින අදාළ ස්ථානයේ ගල් ගසන තෙක් පිරිමිහු හඬ නගා එය පැවසීම | කිසිවක් නැත අංක 2 බලන්න. |
| | | 6 | සුන්නා | මිනාවට පැමිණ රකආත් හතරකින් සමන්විත සලාතයන් රකආත් දෙක බැගින් කෙටි කොට එක් නොකොට ඉටු කිරීම | කිසිවක් නැත |
| දෙවන අදියර | නව වන දිනය (අරෆා දිනය හා මුස්දලිෆා රාත්‍රිය) | 7 | සුන්නා | තල්බියා පවසමින් හිරු උදාවෙන් පසුව අරෆා දෙසට ගමන් කිරීම | කිසිවක් නැත |
| | | 8 | සුන්නා | කුත්බා දේශනාවට සවන් දීම පසුව එක් අදානයක් හා ඉකාමතයක් බැගින් පවසා ලුහර් හා අසර් එක් කොට කෙටි කරමින් ඉටු කිරීම. | කිසිවක් නැත |
| | | 9 | සුන්නා | යටහත් පහත් ව සිත් එක්තැන් කර ගනිමින් කිබ්ලා දෙසට මුහුණ ලා දෑස් ඔසවා ප්‍රාර්ථනාවන්හි නිරත වීම | කිසිවක් නැත |
| | | 10 | වාජිබ් | හිරු අවරට යන තෙක් අරෆාවෙහි රැඳී සිටීම | අංක 3 බලන්න. |
| | | 11 | ජාඉස් | උර්නා නම් ප්‍රදේශය ඇතුළත හැර සෙසු ඕනෑම තැනක රැඳිය හැක. අල්ලාහ්ගේ දූතයාණෝ (සල්) මෙසේ ප්‍රකාශ කළහ. මම මෙතැන රැඳී සිටිමි. අරෆා පුරාම නැවතී සිටින ස්ථාන වේ. නමුත් උරුනා ඇතුළතින් ඉවත් වන්න. | කිසිවක් නැත |
| | | 13 | මක්රූහ් | හජ් වන්දනාකරුවන් අරෆා උපවාසයේ යෙදීම. නමුත් හද්යු ලබා දීමට පහසුකම් නැති උදවිය උපවාසයේ නිරත වීමට අනුමැතිය ඇත. | කිසිවක් නැත |
| | | 14 | සුන්නා | මුස්දලිෆාවට පැමිණ එක් අදානයක් හා ඉකාමතය බැගින් පවසා මග්රිබ් හා ඉෂා සලාතයන් කෙටි කර හා එකතු කර ඉටු කිරීම | කිසිවක් නැත |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | 15 | වාජිබ් | මධ්‍යම රාත්‍රිය දක්වා මුස්දලිෆාවෙහි රැඳී සිටීම | දම් |
| | | 16 | සුන්නා | අලුයම් කාලය දක්වා මුස්දලිෆාවෙහි රැඳී සිටීම ෆජ්ර් සලාතයට පසු හිරු ආලෝකය මැනවින් කහ පැහැ ගැන්වන තෙක් ප්‍රාර්ථනාවන්හි නිරත වීම. නබි () තුමාණෝ මෂ්අරිල් හරාම් වෙත පැමිණ කිබ්ලාවට මුහුණ ලා ප්‍රාර්ථනාවන්හි නිරත වූහ. තක්බීර් පැවසූහ. තහලීල් පැවසූහ. තව්හීද් පැවසූහ. (මූලාශ්‍රය මුස්ලිම්) | කිසිවක් නැත |
| | | 17 | ජාඉස් | මධ්‍යම රාත්‍රියෙන් පසුව දුබලයින් කාන්තාවන් හා ඔවුන්ගේ රැකවරණයට සිටින අය කල් ඇති ව යෑම | කිසිවක් නැත |
| තුන්වන අදියර | දස වැනි දින (නහ්ර් හෙවත් කුර්බාන් දෙන දින) උත්සව දින | 18 | සුන්නා | හිරු උදාවට පෙර අල්ලාහ් ව මෙනෙහි කරමින් අධික වශයෙන් තල්බියා පවසමින් මිනා ව වෙත ගමන් කිරීම | කිසිවක් නැත |
| | | 19 | සුන්නා | මුස්දලිෆාවෙහි සිට මිනාව වෙත යන මාර්ගයේ කවර හෝ ස්ථානයකින් ගල් කැට 7 ක් අහුලා ගැනීම (එම ගල් කඩල ඇටයක තරම් විය යුතුය) | කිසිවක් නැත |
| | | 20 | වාජිබ් | ගල් කැට හත ජම්රතුල් අකබා නම් ස්ථානයට ගැසීම | දමුන් (රුධිර වන්දිය) |
| | | 21 | සුන්නා | එකින් පසු එක, එක දිගට ගල් කැට හත ගැසීම, තම වමත කඃබා ව දෙසටත් දකුණත මිනා දෙසටත් පිහිටන සේ හැරී සෑම ගල්කැටයක් පාසාම තක්බීර් පවසා විසි කිරීම. ඉන් පසුව ප්‍රාර්ථනා නොකළ යුතු අතර ගල් ගසන විට තල්බියා ව නතර කිරීම ද සුන්නා වේ. | කිසිවක් නැත |
| | | 22 | වාජිබ් | තමත්තුඃ ක්‍රමයට හජ් ඉටු කරන්නා හද්යු (සත්ව කැපයක්) ලබා දීම. අවුරුදු දින සිට අය්යාමුත් තෂ්රීක්හි තුන්වැනි දින හිරු අවරට යන තෙක් ලබා දිය හැක. මිනාවේ හෝ මක්කාහ්වේ හෝ කුමන ස්ථානයක වුව ද එය ලබා දීමට අනුමැතිය ඇත. | අංක 4 බලන්න |
| | | 23 | වාජිබ් | හිස මුඩු කිරීම හෝ හිස කෙස් කොට කිරීම. නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් ක්‍රියා කළ අයුරින් හිස මුඩු කිරීම වඩාත් උචිතය. (කාන්තාව සෑම ගෙතුමකම ඇඟිලි තුඩුවක ප්‍රමාණයකින් හිස කෙස් කොට කර ගනී) | දම් (රුධිර වන්දිය) |
| | | 24 | වාජිබ් | ඉල්තිබාඃ හෝ රමල් කිරීමකින් තොරව තවාෆුල් විදා ඉටු කිරීම තමන් පිටත් වන තෙක් එය ප්‍රමාද කිරීමට අනුමැතිය ඇත. එය තවාෆ් අල් විදා ද චේතනා කරමින් එකක් ලෙස ඉටු කළ හැක. | |
| | | 25 | සුන්නා | ගල් විසි කර හිස මුඩු කළ පසුව තවාෆුල් ඉෆාලා ඉටු කිරීම සඳහා මක්කාහ් ව වෙත යාමට අපේක්ෂා කරන හජ් වන්දනාකරු සුවඳ විලවුන් ගැල්වීම | කිසිවක් නැත |
| | | 26 | වාජිබ් | සඃයු හෙවත් සෆා හා මර්වා නම් කඳු වැටි අතර දිවීම | හජ් පූර්ණ නොවේ |
| | | 27 | අනුමතය | ගල් විසි කිරීම, හිස මුඩු කිරීම, තවාෆ් කිරීම යන කරුණු තුනෙන් දෙකක් ඉටු කිරීමෙන් පසුව බිරිය සමඟ සංසර්ගයේ නිරත වීම හැර තහනම් කරනු ලැබූ සෙසු කරුණු අනුමත වේ. මෙය මුල්ම මිදීමය. කරුණු තුනම ඉටු කළ විට ඉහ්රාම් තත්ත්වයෙන් පූර්ණ ව මිදෙනු ඇත. ඔහුට තහනම් වූ කරුණු සියල්ල අනුමත වේ. | කිසිවක් නැත |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | 28 | වාජිබ් | මිනාවෙහි රැඳී සිටීම රාත්‍රියෙන් අඩකට වඩා වැඩි ප්‍රමාණයක් රැඳී සිටීම අනිවාර්යය වේ. | රුධිර වන්දිය |
| | | 29 | සුන්නා | හජ් වන්දනා කරු අවුරුදු දින ගල් විසි කළ පසුව නියමිත තක්බීරය පැවසීමට ආරම්භ කරයි. හජ් හි 13 වැනි දින අසර් සලාතයෙන් පසුව තක්බීර් පැවසීම අවසන් කර ගනී. | කිසිවක් නැත |
| | | 30 | අනුමතය | ගල් විසි කිරීම කුර්බාන් දීම හිස මුඩු කිරීම තවාෆ් කිරීම යන කරුණු වලින් කවර කරුණකින් හෝ ආරම්භ කළ හැක. නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමා මෙසේ ප්‍රකාශ කළහ. මෙසේ ඉටු කිරීම වරදක් නොමැත. | |
| | | 31 | සුන්නා | මිනාවේ දී රකආත් හතරක සලාතයන් ජම්උ කිරීමෙන් තොරව රකආත් දෙක බැගින් කෙටි කර ඉටු කිරීම | |
| හතර වැනි අදියර | අය්යාමුත් තෂ්රීක් හෙවත් 11 වැනි දින 12 වැනි දින හා 13 වැනි දින | 32 | සුන්නා | අනිවාර්යය සලාතයන්ට පසුව තක්බීර් පැවසීම | අංක 5 බලන්න |
| | | 33 | වාජිබ් | ජම්රතුස් සුග්රා පසුව ජම්රතුල් වුස්තා පසුව ජම්රතුල් කුබ්රා යන ස්ථාන වලට පිළිවෙළින් ගල් ගැසීම | රැධිර වන්දිය |
| | | 34 | සුන්නා | ගල් විසි කරන සෑම ස්ථානයකට ගල් කැට හතක් බැගින් එකින් පසු එකක් නොකඩවා ගැසීම. සෑම ගලක්ම විසි කිරීමත් සමඟම තක්බීර් පැවසීම. දහවලට පසුව ගල් ගැසීම සුන්නා වේ. අලුයම උදා වීමත් සමඟ අවසන් වේ. | කිසිවක් නැත |
| | | 35 | සුන්නා | ජම්රතුල් සුග්රා නම් ස්ථානයේ ගල් ගැසීමෙන් පසුව දකුණු දෙසින් මදක් ඉදිරියට ගොස් කිබ්ලා දෙසට මුහුණ ලා දෑත් ඔසවා දීර්ඝ වේලාවක් ප්‍රාර්ථනාවෙහි නිරත වීම | කිසවක් නැත. |
| | | 36 | සුන්නා | ජම්රතුල් වුස්තා නම් ස්ථානයේ ගල් ගැසීමෙන් පසුව වම් දෙසින් මදක් ඉදිරියට ගොස් කිබ්ලා දෙසට මුහුණ ලා දෑත් ඔසවා දීර්ඝ වේලාවක් ප්‍රාර්ථනාවෙහි නිරත වීම | කිසවක් නැත. |
| | | 37 | සුන්නා | ජම්රතුල් අකබාවෙහි ගල් ගසන විට ඔබේ වමත කඃබාව දෙසට ද දකුණත මිනා දෙසට ද පිහිටන සේ ඉද ගල් ගැසීම ඉන් පසුව ප්‍රාර්ථනාවෙහි නිරත නොවේ. | කිසිවක් නැත |
| | | 38 | වාජිබ් | මිනා හි රාත්‍රියෙන් අඩකට වඩා වැඩි ප්‍රමාණයක් රාත්‍රිය ගත කිරීම | රුධිර වන්දිය |
| | | 39 | සුන්නා | 13 වැනි දින දක්වා රැඳී සිටීම. 12 වැනි දින කල් ඇති ව පිටත් වීමට අනුමැතිය ඇත. | කිසිවක් නොමැත |
| | | 40 | වාජිබ් | කල් ඇති ව පිටත් වන්නා ජම්රාත් වලට ගල් ගසා 12 වැනි දින හිරු අවරට යෑමට පෙර මිනාවෙන් පිටත් විය යුතුය. | අංක 6 බලන්න |
| | | 41 | වාජිබ් | ඔසප් නිෆාස් තත්ත්වයේ පසු වන කාන්තාවන් හැර  තවාෆ් අල් විදා ඉටු කිරීම. නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ මෙසේ ප්‍රකාශ කළහ. නුඹ අතුරින් කිසිවකු තම අවසන් ගිවිසුම බයිතුල්ලාවෙහි වන තුරු පිටත් නොවිය යුතුය. | රුධිර වන්දිය |

හජ් ඉටු කරන්නා හෝ උම්රා ඉටු කරන්නා කොන්දේසි පනවා පසුව එම වන්දනාමානය පරිපූර්ණ කිරීමට නොහැකි වූ විටෙක ඔහු කෙරෙහි කිසිදු වන්දියක් නොපැවරේ. නමුත් කිසිදු මිනිසකු කිසිදු කොන්දේසියක් නොපනවා එම වන්දනාමානය පරිපූර්ණ කිරීමට නොහැකි වූ විටෙක ඔහුගේ නීතිය වනුයේ හජ් ඉටු කිරීම වළක්වනු ලැබූ අයකු මෙනි.

(1) තල්බියයා පැවසීමේ ක්‍රමය
(ලබ්බයික් අල්ලාහුම්ම ලබ්බයික්, ලබ්බයික් ලා ෂරීක ලක ලබ්බයික් ඉන්නල් හම්ද වන්-නිඃමත ලක වල් මුල්ක් ලා ෂරීක ලක්)

(2) යමෙකු අරෆාවෙහි රැඳී නොසිටියේ නම් ඔහුට හජ් නොමැත. කවරෙකු හිරු අවරට යාමට පෙර ඉන් පිටත් වන්නේද එවිට ඔහු දම්(සත්ව කැපයක්) දිය යුතු වේ.

(3) හජ් වන්දනාකරුට හද්යු (සත්ව කැපයක්) නොලැබූ විටක ඔහු හජ්හි දින තුනක් උපවාසයේ නිරත විය යුතුය. එම දින තුන් හජ් මස 11, 12, 13, වීම වඩාත් සතුටු දායකය. පසුව දින හතක් තම දේශයට පැමිණි පසු නිරත විය යුතුය.

(4) තක්බීර් පැවසීමේ ක්‍රමය

(5) හිරු අවරට ගිය විට මීනාවෙන් පිටත් නොවිය යුතුය. ඔහු එය ප්‍රමාද කළ යුතුය.

- ඉෆ්රාද් කිරාන් තමත්තුඃ යන ක්‍රම අතුරින් කුමන හෝ ක්‍රමයකින් මුස්ලිම්වරයකුට හජ් ඉටු කළ හැක.
- කිරාන් හා ඉෆ්රාද් අතර වෙනස පහත සඳහන් අයුරිනි.

1- ඉෆ්රාද් ක්‍රමය පදනම් කර ගනිමින් හජ් ඉටු කරන්නා ලබ්බයික් හජ්ජන් යැයි පවසන අතර කිරාන් ක්‍රමය පදනම් කර ගෙන හජ් ඉටු කරන්නා ලබ්බයික් උම්රතන් වහජ්ජන් යනුවෙන් පවසති.

2- ඉෆ්රාද් ක්‍රමය පදනම් කරමින් හජ් ඉටු කරන්නාට සත්ව කැපයක් පිරිනැමිය යුතු නැත. නමුත් තමත්තුඃ ක්‍රමය පදනම් කරමින් හජ් ඉටු කරන්නා හද්යු ලබා දිය යුතු මෙන්ම කිරාන් ක්‍රමය පදනම් කරමින් හජ් ඉටු කරන්නා හද්යු ලබා දිය යුතු වේ.

- ඉහ්රාම් හි තහනම් කරනු ලැබූ කිසිවක් කිරීම තහනම්ය.

| අංකය | තහනම් කරනු ලැබූ දෑ |
|---|---|
| 1 | හිසෙහි හෝ වෙනත් ස්ථාන වල ඇති රෝම ඉවත් කිරීම |
| 2 | නියපොතු කැපීම |
| 3 | සුවඳ විලවුන් පරිහරනය |
| 4 | වැලඳ ගැනීම (අඹු සැමි ඇසුරට මුල් හේතූන්) |
| 5 | සතුන් දඩයම් කොට මරා දැමීම |
| 6 | විවාහ ගිවිසුම් ඇති කර ගැනීම |
| 7 | සංසර්ගයේ නිරත වීම |
| 8 | මසා නිම කළ ඇඳුම් ඇඳීම (මෙය පිරිමියාට අදාළ නීතියකි) |
| 9 | හිස ආවරණය කිරීම (මෙය පිරිමියාට අදාළ නීතියකි) |
| 10 | මුහුණු ආවරණ පැලඳීම (මෙය කාන්තාව අදාළ නීතියකි) |
| 11 | අත් ආවරණ පැලඳීම (මෙය කාන්තාව අදාළ නීතියකි) |

**ඔබට පිළි ගනු ලැබූ හජ් වන්දනාවක් වේවා ! ඔබේ පාපයන් වලට අල්ලාහ් ක්ෂමා කරත්වා ! යැයි පතමින් මෙය ඔබේ වන්දනාව පරිපූර්ණ කිරීමට මහගු භාග්‍යයක් වේවා ! **

හජ්ජි අර්කාන් හෙවත් මූලික කරුණු :

1- චේතනා කොට ඉහ්රාම් ඇඳීම
2- අරෆාවෙහි රැඳී සිටීම
3- තවාෆුල් ඉෆලා හෙවත් තවාෆ් ඉටු කිරීම
4- සෆා හෙවත් සෆා මර්වා අතර මද වේගයෙන් ගමන් කිරීම

හජ්ජි වාජිබාත් හෙවත් අනිවාර්යය ක්‍රියාවන් :

1- නියමිත සීමා මායිම්හි චේතනා තැබීම
2- හිරු අවරට යන තෙක් අරෆාවෙහි රැඳී සිටීම
3- මධ්‍යම රාත්‍රිය දක්වා මුස්දලිෆාවෙහි රැඳී සිටීම
4- අය්යාමුත් තෂ්රීක් රාත්‍රියන්හි මිනාවෙහි රැඳී සිටීම
5- පිළිවෙළට ගල් ගැසීම
6- හිස මුඩු කිරීම හෝ හිස කෙස් කොට කිරීම
7- තවාෆුල් විදා හෙවත් සමුගැනීමේ තවාෆ් ඉටු කිරීම